# ජනශ්‍රැතියේ නිරූපිත ශ්‍රී ලංකාවේ අලි ඇත්තු

දිනීෂා ලියනගේ *

**සංක්ෂේපය**

මුඛ පරම්පරාගතව රැගෙන එන ඥාන සම්භාරය ජනශ්‍රැතියයි. සංස්කෘතික උරුමයන් ගෙන හැර පෑමට ජනශ්‍රැතිය සතු වන්නේ සුවිශේෂ හැකියාවකි. ගැමි ජනයාගේ අනේකවිධ හැඟීම් දැනීම් මැනවින් නිරූපණය කිරීමට ප්‍රබල ශක්‍යතාවයක් ජනශ්‍රැතිය සතුය. ජනශ්‍රැතියේ එන ජනකවි සහ ප්‍රස්තාව පිරුළු එහිදී සුවිශේෂීය. සත්ත්ව සංහතියේ ඉතා වැදගත් සත්ත්ව විශේෂයක් වන අලි ඇත්තු ආදිකල්පිත සමාජයේ පටන් ජනතාවගේ අවධානයට නතු වූ සත්ත්ව කොට්ඨාශයකි. ජනශ්‍රැතිය තුළ එන ජනකවි සහ ප්‍රස්තාව පිරුළු මඟින් නිරූපිත ශ්‍රී ලංකාවේ අලි ඇත්තු පිළිබඳ මෙහිදී අවධානය යොමු කරනු ලැබේ.

**හැඳින්වීම**

අතීතයේ පුද්ගලයාට දැනුම ලබා දුන් ප්‍රබල අධ්‍යාපනික මාධ්‍යයක් වශයෙන් ජනශ්‍රැතිය හඳුනාගත හැකිය. ජනතාව අතරින්ම ඉපදී ජනතාවගේම හැඟීම් දැනීම් අත්දැකීම් විවරණය කරන අතිශය නිර්මාණාත්මක මාධ්‍යයකි ජනශ්‍රැතිය. ශ්‍රැතිගෝචර ගුණය නිසාත් එහි පවත්නා නිර්මාණාත්මක ලක්ෂණ නිසාත් සැබැවින්ම මාධ්‍යයක පැවතිය යුතු ගුණාංග ජනශ්‍රැතියට නොඅඩුව පිහිටා ඇත. ජනශ්‍රැතිය යනු නිර්ව්‍යාජ ගැමි ජනයාගේ සතුටේත්, කඳුලේත්, සිනහවේත්, සන්නිවේදන මාධ්‍යයයි. නිර්මාණශීලී ගුණය අතින් ගත් කළ ජනශ්‍රැතිය ගැමි ජනයාගේ පරිනත බුද්ධිගෝචර මට්ටම හැඳින්විය හැකි බුද්ධිමත් බවේ සංකේතයකි. මුඛ පරම්පරානුගතව පැවත එන මානවයාගේ දැනුම් සම්භාරය ජනශ්‍රැතිය නම් වෙයි. "ඇලෙක්සැන්ඩ් ක්රේප්"නැමැති විද්වතාට අනුව "මානව චින්තනය සැකසීම පමණක් නොව ජනශ්‍රැතීන් මිනිසාගේ මනෝ විද්‍යාත්මක හැඟීම් ප්‍රකට කරන බවද විග්‍රහ වෙයි". පුරාතන මානව සමාජයේ ඉතිහාස ගවේෂණය කාර්යෙහිලා ජනශ්‍රැතිය මූලික මාධ්‍යයකි.

ජනශ්‍රැතිය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එහි පවතින ලක්ෂණ කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකිය.

1. ජනතාවගේ අත්දැකීම් ප්‍රකාශනය
2. විනෝදාස්වාදය
3. සදුපදේශ සම්පාදනය
4. දැනුම පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාම

* සම්බන්ධීකාරක, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන කෙන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය.

5. පුද්ගලාන්තර සන්නිවේදනය

6. අධ්‍යාපනය ලබා දීම

මෙකී ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ වූ ජනශ්‍රැතිය ගැමි ජනයාගේ අධ්‍යාපන අවශ්‍යතාවයට තෝතැන්නක් විය. ගැමි ජනයා පරිහරණය කරන භාණ්ඩ, භාවිත කරන උපකරණ, නියැලෙන වෘත්තීන් එදිනෙදා දකින දෑ මෙන්ම සිය ජීවන අරගලයට පැමිණෙන ජය, පැරදුම, බාධක මෙන්ම කෘෂිකාර්මික ජීවිතයේදී මුහුණ දෙන නන් ආකාර විෂයානුභූතීන් ජනශ්‍රැතියට වස්තු විෂයන් සැපයීය. ඒ ඔස්සේ ජනකතා ජනකවි මෙන්ම ජනශ්‍රැතියේ එන සියලුම ජනශ්‍රැතික අංග නිර්මාණය කර ගන්නා ලදි.

"නූගත් ජනයා සතු ජනශ්‍රැතීන් අතර පැරණි කතා, ප්‍රස්තාව පිරුළු හා ඔවුන්ගේ සංගීතය ඇතුළු ජනකවි ආදිය හමු වෙයි."

මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න, සංස්කෘතිය හා සමාජය, ගොඩගේ, 1971

සංස්කෘතියේ මුඛ්‍ය අංගයක් වන්නේ ජනශ්‍රැතියයි. සංස්කෘතියේ ප්‍රධාන වශයෙන්ම හඳුනාගත හැකි අංග ලක්ෂණ ත්‍රිත්වයකි. එනම් "අදහස්", "ධර්මතා", සහ "භෞතික සංස්කෘතියයි". ජන සමාජයේ පවතින ජනශ්‍රැති ජන කතා ,උපමා, ප්‍රස්තාව පිරුළු ආදී සියල්ල මෙකී "අදහස්" ගණයෙහිලා සැලකිය හැකිය. මෙම ජනශ්‍රැතික අංග සමාජයට "හිතකර අදහස්" වශයෙන් සදුපදේශ සම්පාදන කාර්යෙහිලා ක්‍රියාත්මක වෙයි. අදහස් පිළිබඳ වර්ගීකරණයක් "රොබට් බියෙස්ටෙඩ්" නම් සමාජ විද්‍යාඥයා සිය සමාජ පර්යාය නම් වූ කෘතියේ විග්‍රහ කරයි.

"ආගමික සත්‍යයන්, ආගමික විශ්වාස, මිත්‍යාවන්, පුරාවෘත්ත, සාහිත්‍ය අද්භූත කතා, උපමා, ප්‍රස්තාව පිරුළු හා ජනශ්‍රැති වේ".

පෙරේරා, ටෙනිසන්; සමාජ විද්‍යාව, 2013, පි 83

මේ අනුව ජනශ්‍රැතිය මඟින් ජනතාවට ගුණාත්මක අදහස් සම්පාදනය කළ බව හඳුනාගත හැකිය. ජනශ්‍රැතිය පිළිබඳ නවතම අදහස ඉන්දියාවේදී සාර්ක් රටවල ජනශ්‍රැතිවේදීන්ගේ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් විය. එනම්


"හඬක් නැති මිනිසුන්ගේ හඬ ජනශ්‍රැතියයි". ( Folklore is the voice of the voiceless). ලෙසටය.

මෙහිදී පෙනී යන්නේ උගත් මෙන්ම නූගත් ජනයාටද ජනශ්‍රැතිය මැනවින් බලපෑම්කරන සන්නිවේදන උපාංගයක් බවයි. ජනශ්‍රැතියේ නිරූපිත ශ්‍රී ලංකාවේ අලි ඇත්තු පිළිබඳ හඳුනා ගැනීමේදී මෙම අලි ඇත්තු පිළිබඳ අතීත ජනයාගේ අනේකවිද ජීවිත අත්දැකීම් ප්‍රකාශ කර තිබෙන ආකාරය පෙන්වාදිය හැකිය.

**ජනකවි මඟින් නිරූපිත ශ්‍රී ලංකාවේ අලි ඇත්තු**

ජනශ්‍රැතියේ එන ප්‍රධාන අංගයකි ජන කවිය. "ජනකවිය වනාහි නූගත් ගැමියාගේ සිනහවේත් කඳුළේත් ප්‍රති මූර්තියයි" - නන්දසේන රත්නපාල- ජන කවිවල පවතින්නේ නිර්ව්‍යාජ නිස්කලංක වූ සන්නිවේදනයකි. එය ඇතැම්විටෙක අධ්‍යාපනික විනෝදාස්වාද මාධ්‍යයක් තරමටම ප්‍රබලය.

අලි ඇත්තු පිළිබඳව පවතින ජනකවි අධ්‍යයනයේදී එම ජන කවි අලි ඇත්තු කෙරෙහි කේන්ද්‍ර වූ ආකාරය ප්‍රධාන අංග කීපයක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.




බෞද්ධ සාහිත්‍යයෙහි එන පාරිලෙයිය ඇතාගේ සිට දුටුගැමුණු රජු සමයේ කඩොල් ඇතා ආදී වශයෙන්ද වර්තමානයේ දළදා කරඬුව වඩම්මවන නැදුන්ගමුවේ රාජා හස්තියා දක්වාම විවිධ කාල වකවානුවලදී අලි ඇත්තු පිළිබඳ සාහිත්‍ය ගත තොරතුරු ඕනෑතරම් ග්‍රන්ථ පරිශීලනයේදී හඳුනාගත හැකිය. ඇතැම් ජන කවි පිළිබඳ විමර්ශනයේදී පෙනී යන්නේ මෙම අලි ඇත්තු පිළිබඳ පුරාතන සාහිත්‍යගත තොරතුරුද පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වෙමින් ඒවා ජනකවි උදෙසාද කේන්ද්‍ර වී ඇති බවයි.

අලි ඇත්තු පිළිබඳ පවතින ජනකවි කීපයක් පහතින් දැක්වෙයි. සත්ත්ව සංහතියේ ඉතිරිව පවතින ඉතා දැවැන්ත රූප කායකට උරුමකම් කියන අලි ඇත්තු අතීතයේ පටන් ගෞරවාන්විත සත්ත්ව කොට්ඨාශයක් වශයෙන් ජනතාවගේ අවධානයට නතු වී ඇත. අලි ඇත්තු නිසා ජනයාට විඳින්නට සිඳු වූ  දුක්ක දෝමනස්ස ප්‍රකාශනයද ජනකවිවල අන්තර්ගතය. වර්තමානයේ පවතින අලි මිනිස් ගැටුමටද එකල ගැමියා නිරතුරුවම මුහුණ දී ඇත. කෘෂිකාර්මික ජීවිතයක් ගත කළ අතීත ජනයා සිය භව බෝග අලි ඇතුන්ගෙන් බේරා ගැනීමට නිරතවූ අරගලය මැනවින් පහත ජනකවියෙන් විවරණය කරයි. රාත්‍රී කාලයේ සිය හේනේ උස් ගසක අටවා ගත් පැලකට වී අලින් එළවීම මඟින් ඔවුන් සිය හේන ආරක්ෂා කර ගත්හ. මෙකී ජීවන අරගලය කවියට පෙරලීමෙන් පමණක් සිත සනසා ගත් ඔවුන් අලි ඇතුන්ගේ ජීවිත විනාශ කිරීමෙන් තොරව සිය භව බෝග රැක ගැනීමට තරම් මානවහිතවාදී විය.

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා දමන්නේ
රැක්මෙන් දෙවියනේ කුරහන් බුදින්නේ
දුප්පත්කම නිසයි මා පැල් රකින්නේ

බිඳිති කඩුලූ අලියෝ බැරි නවතින්ඩ
ඉඳිති පඬුරු මේ ලොව හැම දෙවියන්ඩ
යොදති නැකැත් පදමට අසුරා ගන්ඩ
කපති කුරක්කන් දෙවියෝ රැක දෙන්ඩ

පහත සදහන් ජන කවිය මඟින් දේවාලේ පෙරහර සඳහා අලි ඇත්තු ඉතා වැදගත් සම්පතක් බව පෙනී යයි. රාජ සභාවටද අලි ඇත්තු නැතිවමම බැරිය. අතීතයේ රාජ්‍යයන්හි බලය විදහාපෑමේ මුඛ්‍ය ලාංජනයක් වශයෙන්ද අලි ඇත්තු භාවිත කළ බව පෙනේ. මෙම ජනකවිය විදහා පාන්නේ මිනිසා සහ අලි ඇත්තු අතර පවතින සහජීවනයේ සංකේතයයි. වලවේ ගඟ මිනිසුන්ට පමණක් ජල අවශ්‍යතාවය ඉටු කළේ නැත. අලි ඇත්තුද ගංගාවේ කොටස්කරුවන්ය. ස්වභාව ධර්මය සමඟ සහයෝගයෙන් ජීවිත් වූ එකල ගැමියා සහ සත්තු අතර සමීප සබැඳියාවට මෙම ජනකවිය ප්‍රබල නිදර්ශනයකි. වර්තමානයේ මෙන් වනය ආක්‍රමණය කරමින් සිය නිජබිම් වැඩිකර ගැනීමේ බල තෘෂ්ණාව එකල ගැමියා පෙලුවේ නැත. මිනිසාට මෙන්ම සත්තුන්ටද ජීවත්වීමේ අයිතියක් ඇති බවත් එම අයිතිය සුරක්ෂිතකර සත්ත්ව සංහතිය රැක ගැනීමේ පරම යුතුකමද ඔවුන් නිසි ලෙස ඉටු කරන ලදි.

කන්දේ කකා ලන්දේ යන බෝසත්තු
අතමිණි බැඳ පය මිණි බැඳ ජයගත්තු
රාජ සභාවෙන් කරුණා ලැබ ගත්තු
වලවේ ගඟට බැස්සයි ගෝමර ඇත්තු

ජනකවියේ එන දරු නැලවිලි ගීවලද මෙකී අලි ඇත්තු නිරූපණය වීම හඳුනාගත හැකිය. ඉතා ජනප්‍රිය පහත සඳහන් දරු නැලවිලි ගීය තුළදී මවක් සිය බිලිඳා නැලවීමට ඇතින්නියක් පිළිබඳව විවරණය කරයි.

ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා

උග්ගල අලුත්නුවර කතරගම දේවාලය හා රජමහා විහාරයේ පෙරහර සහ එහි අලි ඇත්තු පිළිබඳ විවරණයක් පහත ජනකවි මඟින් විවරණය කරයි. වර්තමානයේ අලි ඇත්තු පෙරහැර සඳහා භාවිත කිරිම සත්ත්ව හිංසනය යටතේ ගෙන බොහෝ පෞද්ගලික ආයතන හා සංවිධාන හඩ නගයි. නමුත් අලුත්නුවර පෙරහැර පිළිබඳ විවරණය කරන මෙම ජනකවිය අලුත්නුවර පෙරහැරට අලි ඇත්තු අත්‍යවශ්‍ය බව ගෙනහැර පායි. එමෙන්ම අතීතයේ පටන් ආගමික වශයෙන් ඉතා වැදගත් වස්තුවක් ලෙසද අලි ඇත්තු පෙරහැර තුළ භාවිත කොට ඇත.

උග්ගල අලුත්නුවර කතරගම දේවාලය හා රජමහා විහාරයේම ඓරාවණ නම්වූ හස්තියා පිළිබඳව විවරණය කෙරෙන පහත ජන කවි මඟින් එම හස්තියා කෙරෙහි ගම් වාසීන් කෙරෙහි වූ අසීමිත භක්ත්‍යාදරය මැනවින් නිරූපිතය. ඓරාවණ තේජෝ බල පරාක්‍රමයෙන් අනූන වූ හස්තියෙකි. සද්දන්ත කුලයේ හස්තියෙකු (අංග පසක් බිම ගැවෙන හස්තීන්) ලෙස හඳුන්වන මේ ඇතා මුලු ශ්‍රී ලංකාද්වීපයටම සම්පතකි. ඓරාවණ පිළිබඳ රසවත් පුරාවෘත්ත ඉතිහාසයක් ඇත. ඓරාවණ ඇතෙක් වුවද මිනිසුන් තුළ මෙම හස්තියා පිළිබඳව වූයේ පුදුමාකාර අව්‍යාජ ගෞරවයකි. ගැමියා එක් අතෙකට ඓරාවණව දුටුවේ වීරයෙක්ය යන හැඟීමෙනි. අනෙක් අතෙට ඓරාවණ කතා මවන්නකු විය. ජන කවියා පහත සඳහන් ජන කවි මඟින් ඓරාවණගේ මරණය නිසා ශෝකයට පත් ගැමියන්ගේ අව්‍යාජ හැඟීම් සිය වස්තු විෂයට කේන්ද්‍ර කොට ගෙන ඇත.

අලුත් නුවර සිට සොඬ අකුලාගෙන වන ගොමුවට යනවාද ඇතා
රත්තරනින් රන් පිට සරසාගෙන පෙරහරකට යනවාද ඇතා
දළ දෙක මුදුනේ කඩුව තියාගෙන දිය කැපුමට යනවාද ඇතා
වස් නැත දෙවියනි සින්දුව කීවට අලුත්නුවර දේවාලේ ඇතා

ලතාවකට අත බිමගා එනකල මළුවේ වට ඇඳි රුවකි අනේ
ගොතා මැණික්ගල් කරවට මාලය ඇතාට දුන්නා මිසක අනේ
ඉතාම ගරු ඇති මහ දේවාලෙට පාක්කුඩම් මළු පහළ උනේ
ඇතා වැටුන බව දන්නේ නැතිවද කපුකම් කරනා මැතිවරුනේ

ඓරාවණ හස්තියාගේ වාසනා බල මහිමය නිසා දේවාලයට සහ විහාරයට වස්තුව පහළ වූ බව පුරාකතාවන්හි අන්තර්ගතය. ඓරාවණ එතරම්ම වාසනාවන්ත හස්තියෙකි. ගැමි ජනයා හස්තියාට දැක්වූ භක්ත්‍යාදරය තුළ මෙකී ගරුත්වය මනාවට පිළිබිඹු කරයි. ජන කවියා මෙම සියලු සිදුවීම් මැනවින් ජන කවියට කේන්ද්‍ර කොට ගෙන ඇත. හස්තියාගේ මිය යාමෙන් ප්‍රකම්පනය වූ හදවත් ඇති ගම්වාසීන් සිය ශෝකය දරාගත නොහී හඬා වැළපෙයි. හස්තියාගේ අතීත මතක ආවර්ජනය කොට ගුණ වර්ණනා කරති. හස්තියා පිළිබඳ සිය බාල පරම්පරාව දැනුවත් කරති. හස්තියාගේ මරණය හමුවේ "දෙවියන් මුවාවුනේ" ඇයි දැයි නැවත නැවත ප්‍රශ්න නඟයි.

කඳ දෙවි රජුගේ මහ දේවාලෙට පාක්කුඩම් මළු පහළ උනේ
අතලන්ඩ වළලු පටලන්ඩ ගිගිරී හඳ ගල ගාවට පහළ උනේ
සඳගල ගාවා ආවඩනා කළ ඉර හඳ දෙදෙනා බලා ගෙනේ
ලංකාවට එළියක් වැටෙනා කළ කොතනද දෙවියෝ මුවා උනේ

**අලි ඇත්තු පිළිබඳ ප්‍රස්තාව පිරුළු**

ජනශ්‍රැතියේ එන ප්‍රස්තාව පිරුළුද ගැමි ජනයාගේ දැනුම වර්ධනය කිරීම උදෙසා මූලික වී ඇත. එක් අතෙකින් ප්‍රස්තාව පිරුළු සදුපදේශ සම්පාදනයෙහිලා බලපෑම්කාරීය. ප්‍රස්තාව පිරුළුවල භාෂාවේ පවතින නිර්මාණාත්මක ලක්ෂණ නිසා එය පුද්ගලයා කෙරෙහි නිර්මාණශීලීව බලපායි.

- කෙටි බව
- ජනතාවට ඉතා සමීප උපමා රූපක භාවිතය
- දන්නා දේ ඇසුරින් නොදන්නා යමක් කීම
- නැවුම් බව

ආදී ලක්ෂණ නිසාම මෙකී ප්‍රස්තාව පිරුළු ගැමියාගේ ඥාන කෝෂය සැකසීමෙහිලා ප්‍රබලය.

අලි ඇතුන් පිළිබඳ ප්‍රස්තාව පිරුළුවලට උදාහරණ කිහිපයක් පහතින් දැක්වෙයි;

1. කනා අලියා ගේ හැටි කිව්වා වගේ
2. ඉදිකටුවෙන් ඇතුන් අදින්න හදනවා වගේ
3. වැහැරුණු ඇතාවත් කොරහෙ නාවන්න බැරිලු
4. ඇතා ගිල්ල දිවුල් ගෙඩිය වගේ
5. ඇතා කෙහෙල් ගස් පෙරලන්නා වගේ
6. අලි ගිය පාරවල් තියෙද්දී කුඹි යන හිල් වහන්නා වගේ
7. අලි ගිය අඩි පාර බලන්න කණ්නාඩි ඕනෑද
8. ඇතාට සිංහ නාදය වගේ
9. ඇතා යන්න ඇරලා වලිගෙන් ඇල්ලුවා වගේ
10. ඇතුන් බලන්නා සේ

මෙම සෑම ප්‍රස්තා පිරුළකින්ම පාහේ හස්තියාගේ බාහිර රූපකාය උපහැරණකොට ගෙන සදුපදේශ සම්පාදනය සිදු කර තිබේ. ඉතා රසවත් මෙන්ම විචිත්‍රවත් කෙටි භාෂාව නිසාම පුද්ගලයාට එය රසවත්ව ග්‍රහණය වීම සිදු වෙයි.

පැරණි සමාජයේ සමාජානුයෝජන ක්‍රියාවලියේදී "ඊ. මෙරිල් ෆ්‍රැන්සිස්" නමැති සමාජ විද්‍යාඥයා පුද්ගලයෙකුට අත්‍යවශ්‍ය කරුණු කිහිපයක් විග්‍රහ කරයි.

1. පුද්ගලයා ජන සමාජයේ මූලික නීති ඉගෙනීම
2. තමා අයත් සංස්කෘතියට අත්‍යවශ්‍ය වූ ශිල්පීය ක්‍රම ඉගෙනීම
3. සමාජ සමූහයේ පිළිගත් සම්මතයන්ට හැම විටකදීම අනුගත වීම
4. පුද්ගලයා තමාට හිමි කාර්ය කොටස නිවැරදිව හඳුනා ගැනීම

මෙකී සමාජානුයෝජන ක්‍රියාවලියට පුද්ගලයා අනුගත වීම සිදු වීම පැරණි සමාජයේදී ජනශ්‍රැතිය අනුසාරයෙන් සිදුවිය. ඒ නිසාම අධ්‍යාපනික මාධ්‍යයක් වශයෙන් ජනශ්‍රැතික අංග සමඟ පුද්ගලයාට

නිරායාසයෙන් එකඟවීමට සිදුවිය. එසේ නොවුනහොත් සමාජයෙන් ප්‍රතික්ෂේපවීම යන කාරණයට නතු වන නිසාත් පුද්ගලයා ජනශ්‍රැතියේ අංග ජීවිතවලට සමීප කර ගැනීමට පසුබට නොවීය.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ අලි ඇත්තු පිළිබඳ ජනශ්‍රැතියේ පවතින ජනකවි සහ ප්‍රස්තාව පිරුළු මඟින් අලි ඇත්තු උපමාවට ගෙන සදූපදේශ සම්පාදනයට එකළ ගැමි ජනයා පෙළඹී ඇති බව පෙනී යයි. අලි ඇත්තු සහ එකල ගැමියන් අතර පැවති දැඩි මානවවාදී සමීප සම්බන්ධතාවයද ජනකවි සහ ප්‍රස්තාව පිරුළු අධ්‍යයනයේදී මනා ලෙස විවරණය වෙයි. මිනිසාගේම දැනුම ඔස්සේ මිනිසා අතරින්ම නිර්ව්‍යාජව උපන් තත් විෂය ඥාන ගවේෂණය දක්වා පුළුල් වී ඇති ආකාරය විග්‍රහ කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කහඳගමගේ, පියසේන. (1999). හේනේ විත්ති. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

කහඳගමගේ, පියසේන. (1999). හේනේ විත්ති. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

නන්දසේන, රත්නපාල. ජනශ්‍රැති විද්‍යාව. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

පෙරේරා,ටෙනිසන්. (2013),සමාජ විද්‍යාව, නුවණී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්

විතාන, ගාමිනී කුමාර (2004). අලි ඇත්තු, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,කොළඹ.

Jane, Yolen.(1988). Favorite Folktales from Around the World (The Pantheon Fairy Tale and Folklore Library). Pantheon,United States.

Mieder, Wolfgang.(2012).Proverbs: A Handbook (International Folkloristic). Peter Lang Publishing Inc


<u>අන්තර්ජාල ලිපි</u>


http://www.silumina.lk/punkalasa/20080427/_art.asp?fn=ar0804271

https://sugv.wordpress.com/W.a,අලුත් නුවර ජන කතා සහ කවි.

http://www.divaina.com/2013/06/20/sarasavi%204.html